(c) www.sinhalalyrics.com

යදමින් බැඳ විලංගු ලා මගේ පුතා රැගෙන යන්
ඉඳිකටු ඇන ඇඟිලි තලා දෙතිස් වදය පමුණුවන්
අළුත් ලොවක් ගැන සිතීම දඬුවම් දෙන වරද නන්
කුමට එරට අධිකරණය නීතිය සහ විනිසුරන්

කකා බිබී නටන අතර නරුම යහළු යෙහෙළියන්
පන්දු කෙළින අතර ඉහල පාසල් වල අමනයන්
රට ගිනිගෙන ඇති වග දුටු මගේ එකම පුතණුවන්
එ ගිනි නිවන මග සෙවීම වරදක්දැයි මට කියන්

ගිනි ගන්නා රටක කෙළින මී හරකුන් වැනි පුතුන්
කුමටද මට මහ විරුවෙකි සිරගෙයි මළ මගෙ පුතුන්
කෝටි ගනන් බිහිවේවා මගේ පුතු වැනි තව පුතුන්
කිරි මව් ලෙස මම ඉන්නම් එවන් පුතුන් ලඟ ළතැම්

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - සරත් දසනායක